PPSC/ES/01/DO/04

# සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවය

1987 අංක 42 - පළාත් සභා පනත හා
1990 අංක 27 - පළාත් සභා (සංශෝධන) පනත
1990 අංක 28 - පළාත් සභා (සංශෝධන) පනත යටතේ,

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් හා සේවකයන්,

- ✦ පත් කිරීම
- ✦ උසස් කිරීම
- ✦ ස්ථාන මාරු කිරීම
- ✦ විශ්‍රාම ගැන්වීම
- ✦ විනය කටයුතු පිළිබඳ

# බලතල පැවරීමේ ලේඛනය

(සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.08.06 දින අනුමත කරන ලදී.)

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා කාර්යාල සංකීර්ණය
නවනගරය - රත්නපුර.

2015.10.23

PPSC/ES/01/DO/04

# සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවය

1987 අංක 42 - පළාත් සභා පනත හා
1990 අංක 27 - පළාත් සභා (සංශෝධන) පනත
1990 අංක 28 - පළාත් සභා (සංශෝධන) පනත යටතේ,

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් හා සේවකයන්,

- ✦ පත් කිරීම
- ✦ උසස් කිරීම
- ✦ ස්ථාන මාරු කිරීම
- ✦ විශ්‍රාම ගැන්වීම
- ✦ විනය කටයුතු පිලිබඳ

# බලතල පැවරීමේ ලේඛනය

(සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.08.06 දින අනුමත කරන ලදී.)

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා කාර්යාල සංකීර්ණය
නවනගරය - රත්නපුර.

2015.10.23

# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වගන්තිය ප්‍රකාරව පළාත් රාජ්‍ය සේවයේ නිළධාරීන් පිළිබඳව බලතල පැවරීම

## පළාත් රාජ්‍ය සේවාව - පත්වීම් බලධාරීන්

| | නිලධාරිගණය | පත්වීම් බලධරයා |
|---|---|---|
| 01 | I. ආණ්ඩුකාරවර ලේකම්, සහකාර ලේකම් පත්කිරීම<br>II පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හා සහකාර ලේකම්වරු පත්කිරීම | ගරු ආණ්ඩුකාරතුමා |
| 02 | සභා ලේකම්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරු හා ප්‍රධාන ලේකම් කාර්යාංශවල නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු, පළාත් ආදායම් කොමසාරිස් හා අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ පත්කිරීම | ගරු ආණ්ඩුකාරතුමා |
| 03 | I. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ පත්කිරීම , පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ පත්කිරීම<br>II.එම තනතුරුවලට පළාත් සභාවේ කාර්යයන් සඳහා පත්වීම් ලබාදීම | I.රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය මත විෂයභාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්<br>II.පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 04 | ප්‍රධාන ලේකම් කාර්යාංශවල ( මුදල්, ආදායම්, විගණන, පාලන පිරිස් හා පුහුණු, ක්‍රමසම්පාදන හා ඉංජිනේරු සේවා) ඒකාබද්ධ රියදුරු හා ඒකාබද්ධ කාර්යාල සේවක සේවයේ නොවනදෙපාර්තමේන්තු ගත කණිෂ්ඨ සේවකයින් පත් කිරීම | ප්‍රධාන ලේකම් |
| 05 | සභා ලේකම් කාර්යාලයට අනුමත දෙපාර්තමේන්තුගත කණිෂ්ඨ සේවකයින් (බංගලා භාරකරු, බංගලා සහායක , හැන්සාඩ් සංස්කාරක) පත් කිරීම | සභා ලේකම් |
| 06 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු (MN-1) සඳහා පත් කිරීම | කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් |
| 07 | පළාත් අමාත්‍යාංශවලට අයත් විෂයන් භාර දෙපාර්තමේන්තු හා අංශවල ඒකාබද්ධ රියදුරු සේවයේ නොවන හා ඒකාබද්ධ කාර්යාලසේවක සේවයේ නොවන දෙපාර්තමේන්තු ගත කණිෂ්ඨ සේවකයින් පත් කිරීම | විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් |
| 08 | නගර සභා සහ ප්‍රාදේශීය සභා තුළ ඒකාබද්ධ රියදුරු සේවයේ නොවන හා ඒකාබද්ධ කාර්යාල සේවක සේවයේ නොවන කණිෂ්ඨ සේවකයින් හා ආදායම් පරීක්ෂකවරුන් පත් කිරීම | පළාත් පාලන විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් |
| 09 | මහනගර සභාව තුළ ඒකාබද්ධ රියදුරු සේවයේ නොවන රියදුරන් හා ආදායම් පරීක්ෂකවරුන් පත්කිරීම | පළාත් පාලන විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් |
| 10 | මහනගර සභාව තුළ ඒකාබද්ධ කාර්යාල සේවක සේවයේ නොවන කණිෂ්ඨ සේවකයින් පත් කිරීම | නාගරික කොමසාරිස් මහනගර සභාව |

සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කොට ඇති බව සහතික කරමි.
ආ.කා/සං.ලේ/ll

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය:-2014.08.06

| | | |
|---|---|---|
| 11 | I. අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා කොට්ඨාශ භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් යන තනතුරුවලට අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් පත් කිරීම<br><br>II. ගුරු උපදේශකවරුන් ලෙස ගුරු සේවාවල නිලධාරීන් පත් කිරීම<br>III. ශ්‍රී ලංකා ගුරු සේවා, ආධුනික හා අභ්‍යාසලාභී ගුරු සේවා නිලධාරීන් පත්කිරීම, විදුහල්පති සේවා පත්වීම් ලාභීන් විදුහල්වලට පත්කිරීම<br>IV. පාසල් අනධ්‍යයන කාර්ය මණ්ඩල පත්කිරීම | අධ්‍යාපන විෂයභාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් |
| 12 | අංක 01 සිට 11 දක්වා තනතුරු හැර අනෙක් සියලුම පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවලට අදාළ නිලධාරීන් හා සේවකයින් පත්කිරීම. සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කොට ඇති බව සහතික කරමි. | සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.
දිනය:-2014.08.06

## පළාත් රාජ්‍ය සේවාව - උසස්වීම් පිළිබඳ බලතල

| අනු අංකය | නිලධාරී ගණය | බලධරයා |
|---|---|---|
| 1 | පත්වීම් බලධාරියා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වන තනතුරු | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 2 | ගුරු සේවයේ නිලධාරීන් | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 3 | පත්වීම් බලධාරියා විෂයභාර අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වන තනතුරු | විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා |

සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කොට ඇති බව සහතික කරමි.

දිනය:- 2014.08.06

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

අභිමානවත් නිර්මාණශීලී විශිෂ්ට පළාත් රාජ්‍ය සේවයක්

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර.
சப்பிரகமுவ மாகாண சபை அரச சேவை ஆணைக்குழு
சப்பிரகமுவ மாகாண சபைக் கட்டிடத் தொகுதி, புதிய நகரம், இரத்தினபுரி.
Sabaragamuwa Provincial Public Service Commission
Sabaragamuwa Provincial Council Complex, New Town, Ratnapura.

මගේ අංකය / எனது இல / My No : PPSC/ES/02/FI/12/49

ඔබේ අංකය / உமது இல / Your No :

දිනය / திகதி / Date : 2017.08. 22

සබරගමුව පළාත් සභාවේ
1. ප්‍රධාන ලේකම්,ස.ප.ස.
2. පළාත් සෞඛ්‍ය ලේකම්, ස.ප.ස.
3. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ස.ප.ස.
4. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ,රත්නපුර/කෑගල්ල

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් පිළිබඳ බලතල පැවරීම්

මගේ සමාංක හා 2014.08.20 දින ලිපිය සමඟ ඔබ වෙත එවා ඇති ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.08.06 දිනැතිව අනුමත කර ඇති බලතල පැවරීමේ ලේඛනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 1990 අංක 28 දරණ පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම කොමිෂන් සභාවට දී ඇති විධානයන් අනුව ඉහත සඳහන් බලතල පැවරීමේ ලේඛනයේ " **පළාත් රාජ්‍ය සේවාව - ස්ථාන මාරු බලධාරීන්** " යටතේ සහකාර/ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ ස්ථානමාරු බලධාරීත්වය පහත සඳහන් පරිදි පළාත් සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත පැවරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2017.08.17 දිනැති ලිපියෙන් ලැබී ඇති බැවින් පහත පරිදි බලතල පවරන බව කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

| නිලධාරී ගණය | බල පරාසය | මාරු බලධරයා |
|---|---|---|
| සහකාර /ලියාපදිංචි වෛද්‍යවරුන් | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති අංශ, කාර්යාල හා දෙපාර්තමේන්තුව තුළ සේවා ස්ථාන අතර | පළාත් සෞඛ්‍ය විෂයයභාර අමාත්‍යාංශයේ ලේකම් |

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පිටපත:-

01. ප්‍රධාන ලේකම්, ස.ප.ස. - උක්ත කරුණට අදාලව ඔබටද පිටපතක් සහිතව මා අමතා ඇති ගරු ආණ්ඩුකාරතුමාගේ 2017.08.17 දින ලිපිය අනුව කාරුණික දැනගැනීමට

02. ආණ්ඩුකාරවර ලේකම්, ස.ප.ස. - උක්ත කරුණට අදාලව ඔබටද පිටපතක් සහිතව මා අමතා ඇති ගරුආණ්ඩුකාරතුමාගේ 2017.08.17 දින ලිපිය අනුව ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ලේකම් / செயலாளர் / Secretary 045-2223227 | කාර්යාලය / அலுவலகம் / Office 045-2222379 | ෆැක්ස් / பெக்ஸ் / Fax 045-2222379 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-Mail ppsc_spc@sltnet.

# පළාත් රාජ්‍ය සේවාව ස්ථාන මාරු බලධාරීන්

| | නිලධාරී ගණය | බල පරාසය | මාරු බලධරයා |
|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවය<br>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය<br>ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය<br>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | පළාත තුළ සේවා ස්ථාන අතර මාරු කිරීම | ප්‍රධාන ලේකම් |
| | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය<br>ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය<br>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සේවය<br>ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | පළාත තුළ සේවා ස්ථාන අතර මාරු කිරීම | අදාළ පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | පළාත තුළ සේවා ස්ථාන අතර මාරු කිරීම | අධ්‍යාපන විෂය භාර පළාත්අමාත්‍යාංශ ලේකම් |
| 02 | වෘත්තීය සමිතිවල සභාපති හා ලේකම් තනතුරු දරණ නිලධාරීන් හා සේවකයින් | පළාත තුළ සේවා ස්ථාන අතර මාරු කිරීම | ප්‍රධාන ලේකම් |
| 03 | (අ) ගුරු, විදුහල්පති හා දීපව්‍යාප්ත සේවාවලට අයත් නොවූ සියළු නිලධාරීන් හා සේවකයින් | පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු අතර, ප්‍රධාන ලේකම් කාර්යාංශ, ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මාරු කිරීම | ප්‍රධාන ලේකම් |
| | (ආ) ගුරු , විදුහල්පති සේවාවලට අයත් නොවූ සියළු නිලධාරීන් හා සේවකයින් | පළාතින් බැහැරට මාරු කිරීම් නිර්දේශ කිරීම | ප්‍රධාන ලේකම් |
| 04 | ඉහත 01, 02,03 හි සඳහන් වූවන් හැර සෙසු නිලධාරීන් හා සේවකයින් | I.අමාත්‍යාංශය යටතේ ඇති අංශ, කාර්යාල හා දෙපාර්තමේන්තු අතර මාරු කිරීම<br>II.දෙපාර්තමේන්තුව තුළ සේවා ස්ථාන අතර | I. විෂය භාර පළාත් අමාත්‍යාංශ ලේකම්<br>II. පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| 05 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සබරගමුව පළාත් රාජ්‍ය සේවයට අයත් ක්‍රීඩා නිලධාරී,ග්‍රාම සංවර්ධන නිලධාරී,ප්‍රජා සංවර්ධන නිලධාරී, සමාජ සේවා නිලධාරී, ජනපද නිලධාරී ,සංස්කෘතික නිලධාරී, | පළාත් තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මාරු කිරීම<br>සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකා[illegible] විසින් අනුමත කොට ඇති බව සහතික [illegible].<br>ආණ්ඩුකාරවර ලේකම්,<br>සබරගමුව පළාත.<br>දිනය:- 2014.08.06 | නිලධාරියා අයත් විෂය භාර පළාත් අමාත්‍යාංශ ලේකම් |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන නිලධාරී, කාර්මික නිලධාරී | පළාත තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මාරු කිරීම | ප්‍රධාන ලේකම් |
| 06 | පළාත් පාලන ආයතන වල සේවය කරන කණිෂ්ඨ සේවකයින් | ආයතනය තුළ සේවා ස්ථාන අතර | පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා |

| | | | |
|---|---|---|---|
| 07 | ඉහත 01 ,02 හා 04 හි සඳහන් අය හැර පළාත් පාලන ආයතනවල සේවය කරන සියළුම නිලධාරීන් හා සේවකයින් | පළාත් පාලන ආයතන අතර මාරු කිරීම | පළාත් පාලන කොමසාරිස් |
| 08 | ඉහත 01, 02 හා 04 හි සඳහන් අය හැර දිස්ත්‍රික්කය තුළ සෞඛ්‍ය අංශයෙහි සේවය කරන නිලධාරීන් හා සේවකයින් | පළාත තුළ (දිස්ත්‍රික් අතර)<br><br>දිස්ත්‍රික්කය තුළ සේවා ස්ථාන අතර මාරු කිරීම | පළාත් අධ්‍යක්ෂ<br><br>ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 09 | ඉහත 01,02 හා 04 සඳහන් අය හැර ගුරු සේවාවට අයත් නිලධාරීන් | වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල නිර්දේශ මත පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය යටතේ පළාත තුල සේවා ස්ථාන අතර ස්ථාන මාරු කිරීම හා පළාතින් බැහැර මාරු නිර්දේශ කිරීම | පළාත් අධ්‍යපන අධ්‍යක්ෂ |
| | ශ්‍රී ලංකා විදුහල්පති සේවය | පළාත තුළ සේවා ස්ථාන අතර ස්ථානමාරු කිරීම | පළාත් අධ්‍යාපන අ[illegible] ලේකම් |
| 10 | ශ්‍රී ලංකා ගුරු සේවය<br><br>සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කොට ඇති බව සහතික කරමි.<br>ආණ්ඩුකාරවර ලේකම්, සබරගමුව පළාත.<br>දිනය:- 2014.08.06 | I. කලාප තුළ ස්ථාන මාරු කිරීම<br><br>II. සේවා අවශ්‍යතා හා විනය හේතු මත කලාප තුල හා පළාත තුල ස්ථාන මාරු කිරීම | විෂය භාර පළාත් අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟතාවය මත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ<br><br>අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශ ලේකම් |
| 11 | පළාත් රාජ්‍ය සේවයට අදාළ තනතුරු දරන සියලුම නිලධාරීන් | අන්තර් පළාත් සහ මධ්‍යම රජය අතර ස්ථාන මාරු | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පළාත් රාජ්‍ය සේවයේ සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම් පිළිබඳ බලධාරීන්

| අනු අංක | නිලධාරි ගණය | බලධරයා |
|---|---|---|
| 1 | ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල නිලධාරීන් හා සේවකයින් | ආණ්ඩුකාරවර ලේකම් |
| 2 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ නිලධාරීන් හා සේවකයින් | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් |
| 3 | ප්‍රධාන ලේකම් කාර්යාලයේ සහ ප්‍රධාන ලේකම් කාර්යාංශ වල සේවය කරන පළාත් රාජ්‍ය සේවා කාර්ය මණ්ඩල නිලධාරීන් | ප්‍රධාන ලේකම් |
| 4 | සභා ලේකම් කාර්යාලයේ සේවය කරන පලාත් රාජ්‍ය සේවා කාර්ය මණ්ඩල නිලධාරීන් හා සේවකයින් | සභා ලේකම් |
| 5 | පළාත් අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල හා නිලධාරීන් හා සේවකයින් | පළාත් අමාත්‍යාංශ ලේකම් |
| 6 | පළාත් පාලන ආයතනවල නිලධාරීන් හා සේවකයින් | පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරී |
| 7 | මහ නගර සභාවේ කණිෂ්ඨ සේවකයින් | නාගරික කොමසාරිස් |
| 8 | දීප ව්‍යාප්ත සේවා නිලධාරීන් හා විදුහල්පති සේවය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කොට ඇති බව සහතික කරමි.
ආණ්ඩු/සංලේ/11

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය:- 2014.08.06

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විශේෂ විශ්‍රාම ගැන්වීම්, වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වීම් හා අනිවාර්ය විශ්‍රාම ගැන්වීම් කිරීමේ බලය

| අනු අංකය | සේවක ගණය | බලධරයා |
|---|---|---|
| 01 | දීප ව්‍යාප්ත සේවා හැර සෙසු සියළු නිලධාරීන් හා සේවකයින් | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තිය යටතේ (විනය හේතුන්මත) විශ්‍රාම ගැන්වීම

| අනු අංකය | සේවක ගණය | බලධරයා |
|---|---|---|
| 01 | දීප ව්‍යාප්ත සේවා හැර සෙසු සියළු නිලධාරීන් හා සේවකයින් සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කොට ඇති බව සහතික කරමි. ආණ්ඩුකාරවර ලේකම්, සබරගමුව පළාත. දිනය:-2014.08.06 | ප්‍රධාන ලේකම් ගේ නිර්දේශය සහිතව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් |

පළාත් රාජ්‍ය සේවාව විනය බලධාරීන් - ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය
පළමු උපලේඛනය ( බරපතල වැරදි)

| අනු අංකය | නිලධාරී ගණය | විනය බලධාරියා |
|---|---|---|
| 1 | ප්‍රධාන ලේකම් කාර්යාංශ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ සභා ලේකම් කාර්යාලයේ පළාත් රාජ්‍ය සේවා නිලධාරීන් හා සේවකයින් | ප්‍රධාන ලේකම් |
| 2 | ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල නිලධාරීන් හා සේවකයින් | ආණ්ඩුකාරවර ලේකම් |
| 3 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේකාර්ය මණ්ඩල නිලධාරීන් හා සේවකයින් | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් |
| 4 | විදුහල්පතිවරුන් | අධ්‍යාපන විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් |
| 5 | ගුරු සේවයේ නිලධාරීන් | -එම- |
| 6 | පළාත් අමාත්‍යාංශ හා එහි පරිපාලනයට යටත් දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල | විෂය භාර පළාත් අමාත්‍යාංශ ලේකම් |
| 7 | මහ නගර සභා සහ නගර සභාවල කණිෂ්ඨ සේවකයින් හැර පළාත් පාලන ආයතනවල කාර්ය මණ්ඩල නිලධාරීන් හා සේවකයින් | පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් |
| 8 | මහ නගර සභා සහ නගර සභාවල කණිෂ්ඨ සේවකයින්<br>I. මහ නගර සභාව<br>II. නගර සභාව<br>III. ප්‍රාදේශීය සභාව | <br><br>නාගරික කොමසාරිස්<br>නගර සභා ලේකම්<br>දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් |

සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කොට ඇති බව සහතික කරමි.
ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත්.
දිනය:- 2014.08.06

පළාත් රාජ්‍ය සේවය විනය බලධාරීන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය
දෙවන උප ලේඛනය (සුළු වැරදි)

| අනු අංකය | නිලධාරී ගණය | විනය බලධරයා |
|---|---|---|
| 1 | ප්‍රධාන ලේකම් කාර්යාංශවල කාර්ය මණ්ඩල නිලධාරීන් හා සේවකයින් | ප්‍රධාන ලේකම් |
| 2 | ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල නිලධාරීන් හා සේවකයින් | ආණ්ඩුකාරවර ලේකම් |
| 3 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ නිලධාරීන් හා සේවකයින් | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් |
| 4 | පළාත් අමාත්‍යාංශවල කාර්ය මණ්ඩල නිලධාරීන් හා සේවකයින් | පළාත් අමාත්‍යාංශ ලේකම් |
| 5 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් හා සේවකයින් | දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| 6 | දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල නිලධාරීන් හා සේවකයින් | දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| 7 | විදුහල්පති/ ගුරු සේවයේ නිලධාරීන් | පළාත් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 8 | පළාත් පාලන ආයතනවල කණිෂ්ඨ සේවකයින් | නාගරික කොමසාරිස්, නාගරික ලේකම්, ප්‍රාදේශීය සභා ලේකම් |
| 9 | පළාත් පාලන ආයතනවල කණිෂ්ඨ සේවකයින් හැර සෙසු නිලධාරීන් හා සේවකයින් | පළාත් පාලන විෂය භාර පළාත් අමාත්‍යාංශ ලේකම් |
| 10 | සභා ලේකම් කාර්යාලයේ පළාත් රාජ්‍ය සේවයේ සෙසු නිලධාරීන් හා සේවකයින් | සභා ලේකම් |

සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කොට ඇති බව සහතික කරමි.
ආකා/සං ලේ/11

දිනය:- 2014.08.[illegible]

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

## 1987 අංක 42 දරණ පළාත් සභා පනත

iv වන කොටස

### පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

31. ජනාධිපතිවරයා විසින් එක් එක් පළාතේ ප්‍රධාන අමාත්‍ය වරයාගේ එකඟත්වය ඇතිව එම පළාතේ ප්‍රධාන ලේකම් වරයා පත්කල යුත්තේය .

32. (1). වෙනත් යම් නීතියක විධිවිධාන වලට යටත්ව එක් එක් පළාතේ පළාත් සභා රජයේ සේවයේ නිලධාරීන් පත්කිරීම , මාරු කිරීම , සේවයෙන් පහ කිරීම හා ඔවුන්ගේ විනය පාලනය මෙයින් එම පළාතේ ආණ්ඩුකාරවරයා සතු කරනු ලබන්නේය.

(2). පළාතක ආණ්ඩුකාරවරයා විසින් , පළාත් සභා රජයේ සේවයේ නිලධරයන් පත් කිරීම , මාරු කිරීම , සේවයෙන් පහ කරීම සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් වූ ස්වකීය බලතල කලින් කල එම පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව ට පවරා දෙනු ලැබිය හැක්කේය.

(3). පළාත් සභා රජයේ සේවයේ නිලධරයන් බඳවා ගැනීමේ පටිපාටි නියම කිරීම සහ ඒ නිලධරයන්ගේ පැවැත්ම පළිබඳ රීතිමාලා නියම කිරීමද උසස් කිරීම් සහ මාරු කිරීම් සිදු කිරීමේදී අනුගමනය කලයුතු ප්‍රතිපත්ති නියම කිරීමද ඒ නිලධරයන් , පත් කිරීම , මරු කිරීම , සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය යන මේ කරුණු පිළිබඳව බලතල ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය හා එකී බලතල පවරාදීමේදී පටිපාටිය නියම කිරීමද ඇතුළුව පළාත් සභා රජයේ සේවයේ නිලධරයන්ට අදාල සියලු කරුණු පිළිබඳව විධිවවිධාන සැලැස්වීම හා ඒ කරුණු තීරණය කිරීම ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන්නේය. බඳවා ගැනීමේ පටිපාටි සහ පැවැත්ම පිළිබඳ රීති මාලා නියම කිරීමේදී ආණ්ඩුකාරවරයා විසින් රජයේ සේවයේ අනුරූපධුර සඳහා නියමිත බඳවාගැනීමේ පටිපාටි සහ රජයේ සේවයේ අනුරූපධුර දරන නිලධරයන් සඳහා නියමිත පැවැත්ම පිළිබඳ රීතිමාලා හැකිතාක් දුරට අනුගමනය කළ යුත්තේය.

33. (1). එක් එක් පළාතේ ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන තැනත්තන් තුන් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙක් ඒ ඒ පළාත සඳහා වන්නේය. ආණ්ඩුකාරවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස නම් කල යුත්තේය.

(2). යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු , පළාත් සභා මන්ත්‍රිවරයෙකු , රජයේ නිලධරයකු , අධිකරණ නිලධරයෙකු හෝ පළාත් සභා රජ්‍ය සේවයේ නිලධරයෙකු වේ නම් , ඒ තැනත්තා පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් නොකළ යුත්තේ ය. නැතහොත් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස නොසිටිය යුත්තේ ය.

(3). පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සැම සාමාජිකයෙක්ම , ස්වකීය අත්සන යටතේ පළාතේ ආණ්ඩුකාරවරයා වෙත යවන ලිපියක් මගින් නියමිත දිනට කලින් සිය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ එම ආණ්ඩුකාරවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස , පත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලයක් සිය ධුරය දරන්නේ ය. එහෙත් ඒ සැම සාමාජිකයෙක් ම නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(4). ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කවර වූ හෝ සාමාජිකයෙකුට සිය කාර්ය වලින් නිවාඩු දිය හැකි අතර, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදු සුකම් ඇති තැනැත්තකු ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය හැක්කේ ය.

(5). පළාත් සභා කොමිෂන් සභාවේ සාමාජිකයකුට එම පළාත සඳහා වූ පළාත් සභාව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවිය යුත්තේ ය. එවැනි යම් සාමාජිකයකුට ගෙවිය යුතු වැටුප පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේ ය. ඒ වැටුප ඒ සාමාජිකයාගේ ධුර කාලය තුළ අඩු නොකළ යුත්තේ ය.

(6). පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ යම් සාමාජික ධුරයක් හිස්ව තිබුන ද, කොමිෂන් සභාවට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. තවද , එවැනි යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත්කිරීමෙහිලා යම් දෝෂයක් හෝ තිබූ පමණින් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් නැතහොත් කටයුත්තක් නිර්බල නොවන්නේ ය, නිර්බල වන්නා සේ නොසැලකිය යුත්තේ ය.

(7). දණ්ඩ නීති සංග්‍රහය ix වන පරිච්ඡේදයේ කාර්ය සඳහා පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවක සාමාජිකයකු රජයේ සේවකයකු ලෙස සැලකිය යුත්තේ ය.

(8). පළාතක පළාත් සභා රාජ්‍ය සේවා  කොමිෂන් සභාව විසින් කරන ලද  යම් පත්වීමක් , මාරු කිරීමේ හෝ සේවයෙන් පහ කිරීමේ  නියමයක් නැතහොත් විනය කටයුත්තක් සම්බන්ධයෙන් කරන ලද වෙනත් යම් නියමයක් වෙනස් කිරීමට, අඩු කිරීමට හෝ අවලංගු කිරීමට ඒ පළාතේ ආණ්ඩුකාරවරයාට බලය ඇත්තේ ය.

34. යම් තැනැත්තෙක් ස්වකීය කාර්ය ඉටුකිරීමෙහිලා හැර , කෙළින්ම හෝ අන් අයුරකින් , කවර වූ හෝ ආකාරයකින් , පළාත් සභා රාජ්‍ය සේවාකොමිෂන්සභාවේ හෝ එහි යම් සාමාජිකයකුගේ හෝ යම් තීරණයකට බලපෑමක් කෙරේ ද නැතහොත් බලපෑමක් කිරීමට තැත් කෙරේද ඒ සැම තැනැත්තෙක්ම වරදකට වරදකරු වන්නේ ය. ජූරි සභාවක් නොමැතිව පවත්වන නඩු විභාගයකින් පසුව මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය.

එසේ වුවද , පළාත් සභා රජයේ සේවයේ ධුරයක් සඳහා ඉල්ලුම් කරන යම් ඉල්ලුම් කරුවකුට හෝ අපේක්ෂකයකුට හෝ යම් තැනැත්තෙකු විසින් සහතිකයක් හෝ චරිත සහතිකයක් දීම මේ වගන්තියේ කිසිවකින් තහනම් නොවන්නේ ය.

35. පළාත් සභා රජයේ සේවයේ යම් ධුරයකට පත් කරනු ලැබූ තැනැත්තෙකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවන උපලේඛණයෙහි දක්වා ඇති ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන තෙක් හෝ දිවුරුම දී ඊට අත්සන් තබන තෙක් ස්වකීය ධුරයට අයත් කාර්යයන් හි නොයෙදිය යුත්තේ ය.

(1)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1990 අංක 27 දරන
## පළාත් සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 ජූලි මස 6 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 ජූලි මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල: ශත 15 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

...මීස ගයක මිල
...යේ අධිකාරී වෙන ...ව වල
...ලැබෙන එක් එක් වර්ගය ...

## 1990 අංක 27 දරන පළාත් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූලි මස 6 වන දින]

ල්.ඩී.—ඕ. 33/90

### 1987 අංක 42 දරන පළාත් සභා පනත සංශෝධනය කිරීම සඳහාවූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1990 අංක 27 දරන පළාත් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඩු නාමය.

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 5 වන වගන්තියෙහි අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 1987 අංක 42 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3 පළාතක ආණ්ඩුකාරවරයා විසින්, ඒ පළාත සඳහා පිහිටුවන ලද පළාත් සභාවක සභාපතිවරයා වෙත කරනු ලබන දැනුම් දීමකින්, එම ආණ්ඩුකාරවරයාගේ මතයට අනුව එම පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු 4 වන වගන්තිය යටතේ එම මන්ත්‍රීවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, දෙනු ලැබ, අත්සන් තබන ලද ප්‍රතිඥාවට නැත හොත් දිවුරුමට පටහැනි වන ආකාරයට නැත හොත් එය උල්ලංඝනය වන ආකාරයට එම දැනුම් දීමෙහි සඳහන් කර ඇති දිනයේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි අවනතභාවය, ප්‍රකාශිතව ම ප්‍රතික්ෂේප කර ඇති බව හෝ පැහැදිලිව ම අත් හැර ඇති බව හෝ දැනුම් දෙනු ලබන අවස්ථාවක, එම දැනුම් දීමෙහි නිශ්චිතව සඳහන් දිනයේ සිට එම පළාත් සභාවෙහි මන්ත්‍රීවරයකු වශයෙන් අසුන් ගැනීමට සහ ඡන්දය දීමට එම මන්ත්‍රීවරයා නුසුදුස්සෙකු විය යුතු ය.".

3. 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— — 5අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"පළාත් සභා විසුරුවා හැරීම.

5අ. (අ) යම් පළාත් සභාවක සම්පූර්ණ මන්ත්‍රීන් සංඛ්‍යාවෙන් අඩකට වැඩි සංඛ්‍යාවක් විසින් දැන්වීමක නිශ්චිතව සඳහන් දින හෝ ඊට ආසන්න දිනයක හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවනතභාවය ප්‍රකාශිතව ම ප්‍රතික්ෂේප කර ඇති බව හෝ පැහැදිලිව ම අත් හැර ඇති බව හෝ 4 වන වගන්තිය යටතේ ඒ මන්ත්‍රීවරයන් විසින්, අවස්ථාවෝචිත පරිදි, දෙනු ලැබ අත්සන්

2—සී 009189—8,860 (90/06)

තබනු ලැබූ දිවුරුම හෝ දෙනුලැබ අත්සන් තබනු ලැබූ ප්‍රතිඥව කඩ කිරීමෙන් අන්‍යාකාරයකින් ක්‍රියා කරනු ලැබූ බව; නැතහොත්

(ආ) යම් දිනයක සිට ඒ පළාත් සභාව සියලු අභිප්‍රායයන් සහ කාර්යයන් සඳහා කර්තව්‍ය ඉටු කිරීම අවසන් කර ඇති බව; හෝ

පළාතක ආණ්ඩුකාරවරයා විසින් ජනාධිපතිවරයා වෙත දැන්වීමක් කරනු ලබන අවස්ථාවක, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් දින සිට ඒ පළාත් සභාව විසිරෙන්නේ ය.".

**අන්තර්කාලීන විධිවිධාන.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුවෙන් මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයක සිට පළාත් සභාවක් විසිරී ඇති අවස්ථාවක, මැතිවරණ කොමසාරිස්වරයා විසින්, මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ සිට එක් සතියක කාලයක් ඇතුළත 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තියෙහි සඳහන් දැන්වීම පළ කරනු ලැබුවහොත්, ඔහු ඒ වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කර ඇති ලෙසට සළකනු ලැබිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1990 අංක 28 දරන පළාත් සභා ( සංශෝධන ) පනත

1987 අංක 42 දරන පළාත් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1990 අංක 28 දරන පළාත් සභා ( සංශෝධන ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියෙ (2) වන උපවගන්තියට ඉක්බිත්ව ම , පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් , ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබෙ :- — ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(2 අ ) යම් පළාතක පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, ඒ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් නියම කරනු ලබන යම් කොන්දේසි වලට යටත්ව, පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ පත්වීම්, මාරුවීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලනය පිළිබඳ බලතල ඒ පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රධාන ලේකම්වරයා වෙත හෝ යම් නිලධරයෙකු වෙත පවරනු ලැබිය හැකිය.

(2 ආ) ඉහතින්ම වූ උපවගන්තිය යටතේ යම් පළාතක පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, එහි බලතල පවරා ඇත්තා වූ ඒ පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රධාන ලේකම්වරයා විසින් හෝ යම් නිලධරයකු විසින් කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් ඒ පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ යම් නිලධරයකුට, ඒ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතිය ඇත්තේය.``

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම. — 5. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (8) වන උපවගන්තියේ `` පළාතක පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් `` යන වචන වෙනුවට `` පළාතක පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යම් අභියාචනයක් මත හෝ අන්‍යාකාරයකින් හෝ . 32 වන වගන්තිය යටතේ යම් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විසින් එහි බලතල පවරා ඇත්තා වූ ඒ පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රධාන ලේකම්වරයා හෝ යම් නිලධරයකු විසින් `` යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම — 6. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ `` පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ එහි යම් සාමාජිකයකුගේ හෝ යම් තීරණයකට `` යන වචන වෙනුවට `` පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ එහි යම් සාමාජිකයෙකුගේ හෝ එවැනි යම් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විසින් පවරන ලද බලතල කිසිවක් ක්‍රියාත්මක කරන පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රධාන ලේකම්වරයකුගේ හෝ යම් නිලධරයකුගේ හෝ යම් තීරණයකට `` යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනුකූලතාවක් ඇතිවුව හොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව. — 7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනුකූලතාවක් ඇතිවුවහොත් , එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.